# 8 වසර බුද්ධ ධර්මය

## 1පාඩම - ගැටළු විසඳමු දැහැමි අයුරින්

### බුදුන් වහන්සේ ගැටලු නිරාකරණය කළඅවස්ථා

1. දේවදත්ත තෙරුන්ගේ පංචවර යාචනය
2. කාන්තාවන්ට පැවිද්ද ලබා දීම
3. චුල්ලපන්තක හිමියන්ගේ රහත් වීම
4. පැවිද්දේ කලකිරුණු නන්ද හාමුදුරුවෝ

# 1.දේවදත්ත තෙරුන්ගේ පංචවර යාචනය

1) භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම ආරණ්‍යක ව විසිය යුතුයි
2) භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම පිණ්ඩපාතයෙන් යැපීම යුතුයි
3) භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම පාංශුකූලික විය යුතුයි
4) භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම වෘක්ෂ මූලික ව විසිය යුතුයි
5) භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වා ම මස් මාංශ වැළඳීමෙන් වැළකී විසිය යුතුයි

# ❖ පංචවර යාචනයේ අරමුණ

සංඝ භේදයක් ඇති කිරීම

- පංචවර යාචනය පිළිබඳ ගැටළුවට බුදුන් වහන්සේ ලබා දුන් විසඳුම

- එම යෝජනා ධර්මයට විනයට විරුද්ධ නොවන නිසා කැමති කෙනෙකුට එය අනුගමනය කළ හැකි බවත් අකමැති කෙනෙකුට එය අනුගමනය නොකර සිටිය හැකියි හැකි බව දේශනා කළ සේක

# පංචවර යාචනය විසඳුම තුළින් ගත හැකි ආදර්ශ

- ගැටලුවකදී ඉවසීමෙන් ක්‍රියා කළ යුතු බව
- සෑම අවස්ථාවකදීම නිදහසේ සිතා විමසා බලා තීරණ ගත යුතු බව
- පුද්ගල අයිතිය හා නිදහස අයිතියට හා නිදහසට ගරු කළ යුතු බව

# 02.කාන්තාවන්ට පැවිද්ද ලබා දීම

- මහා ප්‍රජාපති ඇතුළු කාන්තාවන් පන්සියයක් කාන්තාවන්ට පැවිද්ද ලබාදෙන ලෙස ඉල්ලා සිටීම
- බුදුන් වහන්සේ මහා ප්‍රජාපතී ගෝතමියගේ ඉල්ලීම අවස්ථා තුනකදීම ප්‍රතික්ෂේප කරමින් මේ ඒ සඳහා අවස්ථාව නොවේ යැයි පවසා සිටීම

- බුදුන් වහන්සේ මුහුණ දුන් ගැටලුව

බමුණු සමාජය දිගු කාලයක් පුරාම කාන්තාව පහත්කොට සැලකීම

# බමුණු සමාජය තුළ කාන්තාවට අහිමි වූ මූලික අයිතිවාසිකම්

1) කැමති ආගමක් ඇදහිය නොහැකි වීම
2) ආගමික පුද සිරිත් සඳහා සහභාගි විය නොහැකි වීම
3) ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම ට හෝ ඉගෙනීමට අවස්ථාව ලබා නොදීම
4) කැමති රැකියාවක් කළ නොහැකි වීම
5) රාජ පාලනයට අවස්ථාව නොදීම
6) අධිකරණය ඉදිරියේ යුක්තිය ඉටුකර දෙන්නේ ඉටු කර දෙන්නැයි ඉල්ලා සිටීමට නොහැකි වීම
7) කිසිදු දේපලක් තබා තබා ගැනීමට තබා ගැනීමට අයිතිය නොතිබීම

- කාන්තා පැවිද්ද ලබා ගැනීමේ ගැටළුවට බුදුන් වහන්සේ ලබාදුන් විසඳුම

- අෂ්ට ගරු ධර්ම පිළිගන්නේ නම් කාන්තා පැවිද්ද ලබාදීමට එකඟවීම

# අෂ්ට ගරු ධර්ම

1) උපසම්පදාවෙන් වස් සියයක් ඉක්මවූ මෙහෙණිය වුවද එදිනම උපසම්පදාව ලද භික්ෂුව දැක වැදිය යුතුය ගරු කළ යුතුය
2) භික්ෂූන් වහන්සේ නොමැති පෙදෙසක මෙහෙණිය වස් නො විසිය යුතුය
3) මසකට දෙවරක් මෙහෙණිය භික්ෂූන් වහන්සේලාගෙන් වහන්සේලා ගෙන් උපදෙස් ලබා ගත යුතුය
4) වස් අවසානයේ දී භික්ෂු භික්ෂුණී උභතෝ සංඝයා හමුවේ දී මෙහෙණිය පවාරණය කළ යුතුය
5) ඇවතකට පත් මෙහෙණිය භික්ෂු-භික්ෂු භික්ෂුණී උභතෝ සංඝයා කෙරෙහි මානත් පිරිය යුතුය
6) දෙවසරක කාලයක් ශික්ෂා මානවකව ( පුහුණු වන්නිය ක ) සිට උපසපන් විය යුතුය
7) මොන ම කරුණක් නිසාවත් නිසා වත් මෙහෙණිය භික්ෂූන් වහන්සේ නමකට ආක්රෝශ පරිභව නොකළ යුතුයි
8) මෙහෙණිය භික්ෂූන් වහන්සේට අවවාද නොකළ යුතුය භික්ෂූන් ගේ අවවාද මෙහෙණිය පිළිගත යුතුය

# කාන්තා පැවිද්ද ලබා දීමේ විසඳුම තුළින් ගත හැකි ආදර්ශ

- ඇතැම් ගැටලු සඳහා විසඳුම් ලබාදීමට නිසි කාලය හා අවස්ථාව එළඹෙන තෙක් ඉවසීමෙන් කටයුතු කිරීම වැදගත් බව

# 03.චුල්ලපන්ථක හිමියන් රහත් වීම

- චුල්ල පන්තක හා මහා පන්ථක නමින් සහෝදරයන් දෙදෙනෙක් බුදුසසුනෙහි පැවිදි වීම
- මහාපන්ථක හිමියන් භාවනා කොට කෙටි කාලයකින් රහත් වීම

## චුල්ල පන්ථක හිමියන් මුහුණ දුන් ගැටලුව

- ගාථා කොපමණ පාඩම් කරත් කළත් මතක තබා ගැනීමට නොහැකි වීම නිසා මහා පන්ථක හිමි පාඩම් කල නොහැකිනම් ආපසු ගෙදර යන ලෙස පැවසීම

# චුල්ලපන්ථක හිමියන්ගේ ගැටළුවට බුදුන් වහන්සේ ලබා දුන් විසඳුම

- සුදු රෙදි කැබැල්ලක් අතට දී "රජෝ හරනං ,රජෝ හරනං "යනුවෙන් පවසමින් එම රෙදි කඩ පිරිමදින ලෙස පවසා තම උත්සාහයෙන් ධර්මය අවබෝධ කර ගැනීමට සැලැස්වීම

# ❖ චුල්ලපන්ථක හිමියන්ගේ ගැටළුවට ලබා දුන් විසඳුම තුළින් ගත හැකි ආදර්ශ

- ඉක්මන් තීරණ නොගැනීම ගැටලුවකදී ඉවසිලිවන්තව බුද්ධිමත්ව කටයුතු කිරීම
- අකුරු ලිවීමට කියවීමට ඇති හැකියාව මත දක්ෂ හෝ අදක්ෂ බව තීරණය කළ නොහැකි බව.
- නිසි මඟ පෙන්වීම මත දක්ෂතා හා හැකියාවන් දියුණු කර ගත හැකි බව.

# 04.පැවිද්දේ කලකිරුණු නන්ද හාමුදුරුවෝ

- බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වී වසරකට පසු කිඹුල්වත්පුරට වැඩම කළ අවස්ථාවේ නන්ද කුමරු මහණ කිරීම

## නන්ද හිමියන් මුහුණ දෙන ගැටලුව

- නන්ද කුමරු විවාහ වීමට සිටි ජනපද කල්‍යාණිය සිහිපත් වීම නිසා සිත එකඟ කරගනිමින් භාවනා කළ නොහැකි වීම

# නන්ද තෙරුන්ගේ ගැටළුවට බුදුන් වහන්සේ ලබා දුන් විසඳුම

- නන්ද හිමි දෙව්ලොවට කැඳවාගෙන ගොස් දෙවඟනන් පෙන්වමින් නන්ද හිමියන්ගේ සිත වෙන අරමුණකට යොමු කිරීමට කටයුතු කිරීම

## නන්ද හිමියන්ගේ ගැටළුවට ලබා දුන් විසඳුම තුළින් ගත හැකි ආදර්ශ

- තැනට සුදුසු නුවණ මෙහෙයවා උපායශීලීව කටයුතු කිරීම

පැවරුම

- ඔබේ යහළුවෙකුට ඇතිවූ ගැටලුවකදී ඔබ ලබාදුන් සාර්ථක විසඳුම් ලියා දක්වන්න